සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டு இறுதிமதிப்பீடு - 2021
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 6 | විෂයය / பாடம் / Subject: **ක්‍රිස්තියානි ධර්මය** | පත්‍රය / வினாத்தாள் / Paper: 1,2 | පැය / மணித்தியாலம் / Hours: 2 |

පහත සඳහන් සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1. මල්වල සුවඳ, අව්වේ රස්නය හා උණුසුම, සුළගේ සිසිල දැනෙන විට, අපට ඇතිවන හැඟීම විය යුත්තේ

    1. අප අවට පරිසරය අලංකාර බවය
    2. දේව මැවිල්ලේ මනහර බවට නිරතුරුව දෙවිඳුන්ට තුති පිදිය යුතු බවය
    3. දේව මැවිල්ල ප්‍රයෝජනයට ගත යුතු බවය.
    4. මනුෂ්‍යයා වන අප ඊට ඉහලින් සිටිය යුතු බවය

2. දේව නිර්මාණයේ මුදුන් මල්කඩ වන්නේ

    1. ගස්වැල් 2. මිනිසා 3. සතුන් 4. කුරුල්ලන්

3. විශේෂ කාල වකවානු තීරණය කිරීමට යොදාගනු ලබන්නේ,

    1. සූර්යයා 2. තාරකා 3. චන්ද්‍රයා 4. දේදුන්න

4. ''දෙවියන් වහන්සේ තම .................... අනුව මිනිසා මැවූ සේක''

    1. ස්වරූපයට 2. අලංකාරයට 3. ආදරයට 4. ගුණාංගයට

5. ජේසුස් වහන්සේගේ උපත මුලින්ම දැනුම් දෙනු ලැබුවේ,

    1. රජවරුන්ට 2. ශාස්ත්‍රවන්තයන්ට 3. එඬේරුන්ට 4. ජනතාවට

6. ජුදෙව් ව්‍යවස්ථාවට අනුව දරුවෙකු වැඩිහිටියෙකු ලෙස පිළිගන්න වයස වන්නේ,

    1. අවුරුදු 12 2. අවුරුදු 10 3. අවුරුදු 15 4. අවුරුදු 30

7. ජේසුස් වහන්සේගේ දුක් විඳීම හා මරණය සිහිපත් කරනු ලබන්නේ,

    1.පාස්කු දින 2.මහා සිකුරාදා 3. මහා බ්‍රහස්පතින්දා 4. ආලෙලූයා සෙනසුරාදා

8. කුරුසිය උසුලාගෙන යාමට ජේසුස් වහන්සේට උදව් කරනු ලැබුවේ,

    1.සීමොන් 2.කිරේනියේ සීමොන් 3.ජෝසෙප් 4.අරිමාතියේ ජෝසෙප්

9. ජේසුස් වහන්සේගේ පුනර්ජීවනය මුලින්ම අත්දකිනු ලැබුවේ,

    1.කාන්තාවන්ය 2.ගෝලයන්ය 3.ජනතාවය 4.එඬේරුන්ය

10. ඔබ ලෝකයේ ...................ය. හිස්තැනට සුදුසු වන්නේ,

1.අන්ධකාරය 2.ආලෝකය 3.බලයය 4.මාර්ගය

11. ජේසුස් වහන්සේ පාළුකරයට ගෙනයනු ලැබුවේ,

1.දේව දූතයන් විසිනි 2.සාතන් විසිනි 3.ශුද්ධාත්මයාණන් විසිනි 4.ස්නාවක ජොහාන් විසිනි

12. ඵතියෝපිය ජාතික මිනිසාට දේව වචනය පහදා දුන්නේ,

1.පේදුරු ය 2.පිලිප් ය 3. ස්තේපන්ය 4.ජොහාන් ය

3. ජේසුස් වහන්සේට ස්තුති කිරීමට නැවත පැමිණියේ,

1.ලාදුරු රෝගින් 10 දෙනෙකි 2.ලාදුරු රෝගින් 05 දෙනෙකි

3.ලාදුරු රෝගි එක් කෙනෙකි 4.ලාදුරු රෝගින් 12 දෙනෙකි

14. නිහතමානිව, පසුතැවිලි වී යාච්ඤාවේ යෙදුනේ,

1.පරිසිවරයා 2.අයකැමියා 3.පූජකතුමා 4.ලෙවියා

15. පුරාණ ගිවිසුම මුලින්ම ලියනු ලැබුවේ,

1.ග්‍රීක බසිනි 2.රෝම බසිනි 3.හෙබ්‍රෙව් බසිනි 4.ලතින් බසිනි

16. දෙවියන්වහන්සේ මෝසෙස් මගින් ජනතාවට ප්‍රධානය කල දසපණත තුළින් අද අපට තේරුම් ගත හැකි වනුයේ

1. මෝසෙස්ට ඊශ්‍රායෙල් ජනතාව පාලනය කිරීමට උපකාර වූ බවයි

2. මෝසෙස්ට තවතවත් වගකීම් පැවරුණු බවයි

3. දෙවියන්වහන්සේ සමගත් මිනිසා සමගත් යහපත් සබඳතාවයකට මග පාදන බවයි

4. දෙවියන්වහන්සේගේ නීති පද්ධතිය ගෙනහැර දැක්වූ බවයි

17. සහෝදර ප්‍රේමය නිසා ධෛර්යයෙන් සහෝදරයාව සුරැකීමට ඉදිරිපත් වූයේ,

1.දෙබෝරා 2.මරියා 3. මීරියම් 4.මාර්තා

18. ''දෙවියන්වහන්සේගෙන් ඉල්ලා ගත්, යන අර්ථය ඇති නාමය වන්නේ

1.ජොහාන් 2.මෝසෙස් 3. සාමුවෙල් 4. සාවුල්

19. තම ආදරණීය පුත්‍රයා දෙවියන්වහන්සේට කැප කළ මව වන්නේ

1.හන්නා 2. මරියා 3. එල්කානා 4. පෙනින්නා

20. කිතුනු දරුවකු ලෙස අප තුළ නොපැවතිය යුත්තේ

1. හැකිතරම් සම්පත් රැස්කිරීම 2.දේව කැමැත්තට අනුකූලව ජීවත් වීම

3.වැඩිහිටියන්ට කීකරුව දිවි ගෙවීම 3.දෙවිඳුන්ගේ හා මිනිසුන්ගේ ප්‍රසාදය ලැබීම

ලකුණු 2×20 = 40

## 2 කොටස

පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්න අතරින් ප්‍රශ්න 04 ක් තෝරාගෙන පිළිතුරු ලියන්න. පිළිතුරු ලිවිය යුතු මුලු ප්‍රශ්න සංඛ්‍යාව 5කි.

1.
1. දේව මැවිල්ලේ නිර්මාතෘ වන්නේ කවුරුන්ද ?
2. දේව සබඳතාව පවත්වා ගැනීමට ඔබතුල තිබිය යුතු යහපත් ගුණාංග 2ක් ලියන්න.
3. එම්මාවුස් ගමට ගිය ගෝලයින් ජේසුස් වහන්සේ හඳුනාගත්තේ කුමන අවස්ථාවේදී ද?
4. ස්නාවක ජොහාන්තුමා ජනතාවට ආරාධනා කළේ කුමක් සඳහාද ?
5. ජේසු බිලිඳු හඳුනා ගැනීමට දේවදූතයා දුන් ලකුණ කුමක්ද
6. ජුදෙව් පාස්කුව මගින් සිහිපත් කරනු ලබන්නේ කුමක්ද ?
7. ජේසුස් වහන්සේගේ උත්ථාන වීම සියසින් දුටු දෙදෙනෙක් නම් කරන්න
8. කිතුනුවන්ට ඇති විශේෂිත බලාපොරොත්තුව කුමක්ද ?
9. ජේසුස් වහන්සේ බෞතීස්මයේදී ස්වර්ගයෙන් නික්මුණු හඬ කුමක්දැයි සඳහන් කරන්න
10. ස්නාවක ජොහාන්තුමාගේ දෙමව්පියන් නම් කරන්න

ලකුණු 2×10 = 20

2.
1. ජේසුස් වහන්සේ පාලුකරයේ දින කීයක් උපවාසයෙන් යුතුව යාච්ඤාවේ යෙදුණාද ? (ල. 02)
2. ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා 03 ලියා දක්වන්න. (ල. 03)
3. කිතුනු ඔබේ ජීවිතයට පරීක්ෂා එන විට ජේසුස්වහන්සේ පරීක්ෂා ජයගත් ලෙස ඔබ ක්‍රියා කරන්නේ කෙසේදැයි කරුණු 5 ක් ලියන්න. (ල. 05)

3.
1. මාගේ අසල්වැසියා කවරෙක්දැයි ජේසුස්වහන්සේගෙන් ප්‍රශ්න කලේ කවුරුන්ද ? (ල. 02)
2. යහපත් සමරිතානුවරයා පිළිබඳ උපමා කථාවේ චරිත තුනක් නම් කරන්න. (ල. 03)
3. ඔබට සමරිතානුවරයා මෙන් අන් අය වෙනුවෙන් කළ හැකි සේවා 05 ක් ලියන්න. (ල. 05)

4.
1. ජේසුස්වහන්සේ උත්ථාන වී දින කීයකට පසුව ස්වර්ගාරෝහණය සිදුවීද? ඊට දින දහයකට පසුව සිදුවූ වැදගත් සිදුවීම කුමක්ද? (ල. 02)
2. ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණයට පෙර ශ්‍රාවකයන්ට පැවරූ වගකීම සහ පොරොන්දුව කුමක්ද? (ල.03)
3. ජේසුස්වහන්සේගේ ජීවිතාදර්ශය පිළිබඳව ඔබේ මිතුරෙකුට පවසන ආකාරය කරුණු 5කින් දක්වන්න. (ල.05)

5. 1. ශුද්ධ බයිබලයේ ප්‍රධාන කොටස් කීයද? ඒ මොනවාද? (ල. 02)

2. පංච පුස්තකයට අයත් පොත් 3ක් නම් කරන්න. (ල. 03)

3. ශුද්ධ බයිබලය කියවීමෙන් ඔබ ලබන මගපෙන්වීම් 5 ක් ලියන්න. (ල. 05)

6. 1. දාවිත්ගේ පියාගේ නම හා දාවිත්ගේ සහෝදරයන් ගනන කීයද? (ල. 02)

2. දාවිත් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබමින් කළ ක්‍රියාවන් දෙකක් ලියන්න. (ල. 03)

3. ඔබ ලත් විශේෂ දීමනා තුළින් දේව ගෞරවය පිණිස ඔබට පාසලේදී, පවුලේදී හා සමාජයේදී කළ හැකි සේවා 5 ක් ලියන්න. (ල. 05)

7. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන එහි ඇති කරුණු ඇතුළත් වන සේ කෙටි සටහන් ලියන්න.

1. මීරියම් - දෙමව්පියන්, ඇය කළ ක්‍රියාව, ආදර්ශ
2. දාවිත් - දෙමව්පියන්, ඔහු කළ ක්‍රියා, ආදර්ශ
3. සාමුවෙල් - දෙමව්පියන්, හැදුනු වැඩුනු අයුරු, ආදර්ශ
4. ජේසුස් වහන්සේගේ ළමා කාලය - දෙමව්පියන්, හැදුණු වැඩුණු ආකාරය, ආදර්ශ

(ල. 5ං2 - 10)

# පිළිතුරු පත්‍රය

## 6 ශ්‍රේණිය ක්‍රිස්තු ධර්මය

## I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01 - 2 | 06 - 1 | 11 - 3 | 16 - 3 | |
| 02 - 2 | 07 - 2 | 12 - 2 | 17 - 3 | |
| 03 - 3 | 08 - 2 | 13 - 3 | 18 - 3 | |
| 04 - 1 | 09 - 1 | 14 - 2 | 19 - 1 | |
| 05 - 3 | 10 - 2 | 15 - 3 | 20 - 1 | 2X20 - 40 |

01. 1. දෙවියන් වහන්සේ
2. දයාව/ඉවසීම/කමාව/එකමුතුකම ආදී පිළිතුරු
3. රොටි කඩා ආශීර්වාදය පවසන මොහොතේ
4. මනස්ථාපනය වී බෞතීස්ම ස්නාපනය ලැබීමටය.
5. 'රෙදි වලින් ඔතා ගව ඔරුවක බාවා සිටින බිළිඳෙක්''
6. ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්කමින් මිදී කානාන් දේශය කරා ගමන් කිරීම.
7. මග්දලායේ මරියා , එම්මාවුස් ගමට ගිය ගෝලයින් දෙදෙනා, ශ්‍රාවකයින් 11 දෙනා
8. සදාතන ජීවනය උරුමකර ගැනීම
9. ''මේ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. මොහු කෙරේ ඉතා ප්‍රසන්නව සිටිමි''
10. එලිසබෙත් සහ සෙකරියස්. 2X10 - 20

02. 1. දින 40 කි. (ල 2)
2. 1. ඔබ දේව පුත්‍රයා නම් මේ ගල් ගෙඩිය පාන් ගෙඩියක් වන්නට අණ කළ මැනව.
   2. ලෝකයේ සියලු රට රාජ්‍යයන් පෙන්වා ඒවායේ අයිතියද යස ඉසුරු ද ඔබට දෙන්නෙමි. ඒවා මට පවරා දී ඇති හෙයින් කැමති කෙනෙකුට ඒවා දෙමි. එබැවින් ඔබ මා ඉදිරියේ නමස්කාර කරන්නේ නම් මේ සියල්ල ඔබ සන්තක වන්නේය.
   3. ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මෙතනින් පහලට පනින්න. ඔබට රැකවරණය සළසනු වස් උන්වහන්සේ සිය දූතයන් හට අණ දෙනු ඇත. (ල 3)
3. සිසුන් ලියා ඇති පිළිතුරට අනුව ලකුණ ලබාදෙන්න. (ල 5)

03. 1. විනයධරයා (ල 2)
2. ජුදෙව් ජාතික මිනිසා, ජුදෙව් පූජකවරයා , ලෙවී මිනිසා, යහපත් සමාරිතයා (ල 3)
3. නිසි පරිදි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු පිරිනමන්න. (ල 5)

04. 1. දින 40 කට. පෙන්තකොස්ත සිදුවීම / ශුද්ධාත්ම ආගමනය (ල 2)
2. ශුද්ධාත්මයාණන් ඔබ කෙරෙහි පැමිණි කල ඔබ බලය ලබන්නාහුය. එවිට නුඹලා යෙරුසලමෙහි ද මුළු යුදයෙහි ද සමාරියෙහි ද පොළොවේ සීමාන්තයන් දක්වා ද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය. (ල 3)
3. සිසුන් ලියා ඇති පරිදි සුදුසු පිළිතුරට ලකුනු ලබා දෙන්න. (ල 5)

05. 1. කොටස් දෙකයි. පුරාණ ගිවිසුම. නව ගිවිසුම (ල 2)
2. උත්පත්ති, නික්මයාම, ලෙවී කථාව, ගණන් කතාව, ද්විතීය නීති සංග්‍රහය (ල 3)
3. හික්මවීම, දුර්මත දුරු කිරීම, දේවපියාගේ කැමැත්ත දැන ගැනීම, දේව වචනය ඉගෙලනීමට හා ඉගැන්වීම ආදි ගැලපෙන පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න. (ල 5)

06. 1. වීනා නාදනය, තම බැටලුවන් සතුරන්ගෙන් ආරක්ෂා කිරීම, නිවැරදි ඉලක්කය ගැනීම (ල 2)
2. සිංහයන්ගෙන් වලසුන්ගෙන් පවා බැටළුවන් ආරක්ෂා කිරීම. ගෝලියත් යෝධයා සමඟ සටන් කර ජයග්‍රහණය ලැබීම. නපුරු බලවේග පරාජය කිරීම. (ල 3)
3. නිසි පරිදි ලියා ඇති පිළිතුරු වලට ලකුණු ලබාදෙන්න. (ල 5)

07. 1. මීරියම් -21 පාඩම
2. දාවිත් - 20 පාඩම
3. සාමුවෙල් - 22
4. ජේසුස් වහන්සේගේ - 5 පාඩම

(ලකුණු: 05×2 = 10)